
සන්නිවේදනය

# රූපවාහිනී ජාලය ලොව ගිලගත් හැටි



තිළිනි රත්නායක

**එ 1883 වසරේ සීතල උඳුවප් මාසයේ නත්තල් දිනය යි. එක්තරා තැනැත්තෙක් යම් කිසි දෙයක් පිළිබඳව පැහැදිලි කරමින් සිටි යි. ඔහු වටා විශාල පිරිසක් රොක් වී සිටි යි. සිය දෙනෙත් අදහාගත නොහැකි වූවාක් මෙන් ඔවුන් සියලු දෙනා, සර්පිලාකාරව සිදුරු කළ කරකැවෙන තැටියකින් දුර්වල රූපයක් තිරයක් තුළින් මතුවෙන අන්දම විස්මයෙන් බලා සිටියි.**

මෙම සිදුවීම යකාගේ පෙට්ටිය, එකැස් යෝධයා වැනි අන්වර්ථ නම්වලින් හඳුන්වන "රූපවාහිනිය" නමැති නවතම උපකරණය ලොවට අනාවරණය කරගැනීම සඳහා පෙරනිමිති පහළ කළ අත්හදා බැලීම යි. ජර්මන් ජාතික **පෝල් නිප්කොව්** එහි පුරෝගාමියා විය. ඔහු ගේ මෙම සොයා ගැනීම විදුලි ටෙලස්කෝප්පය ලෙස හැඳින්වූ අතර පසු කලෙකදී එය "නිප්කොව් තැටිය" (NIPKOW DISK) ලෙස භාවිතයට ගැණුනා. 1883 නත්තල් දිනයේ දී එයට පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට පෝල් නිප්කොව්ට හැකි වූවා.

නිප්කොව් ගේ පර්යේෂණයන් භාවිතයට ගනිමින් ඇමරිකාව, රුසියාව, බ්‍රිතාන්‍ය වැනි රටවල් ක්‍රමවත් රූපවාහිනී යන්ත්‍රයක් නිර්මාණය කර ගැනීමට උත්සුක වූවා. මේ අනුව ඇමරිකානු ජාතික පිලෝ. ටී. ෆ්‍රූන්ස්වර්ත් (PILLOI T. FRANSWORTH) සරල නිප්කොව් තැටිය වර්ධනය කරමින් විද්‍යුත් ක්‍රියාවලියක් මගින් රූප ලබා ගත හැකිවන පරිදි එය සකස් කරනු ලැබුවා.

I වන ලෝක සංග්‍රාමය ආරම්භ වූයේ ද රූපවාහිනිය මෙලෙස පර්යේෂණ අවදියේ පසුවන කාලය අතර තුරදී යි. මේ කාලේ සන්නිවේදන කටයුතු පිළිබඳ ව රට රටවල අවධානය වෙසෙසින් ම යොමු වී තිබුණා. රුසියානු ජාතිකයෙක් වූ ව්ලැඩිමර් ෂ්වොරින් (VIADIMIR K. ZWORYKIN) ට යුධ තොරතුරු ප්‍රචාරය සඳහා ගුවන් විදුලිය යොදා ගැනීම සම්බන්ධව පර්යේෂණයක් සිදු කිරීමට ඇමරිකාව බලා පැමිණීමට සිදු වූයේ ද එහි ප්‍රතිඵලයක් ලෙස යි. එතෙක් ඔහු රුසියාවේ TSA NICHOLAS නමැති යුද හමුදා බලකායේ මාධ්‍ය විශේෂඥයා වශයෙන් කටයුතු කරනු ලැබුවා. 1923 ඇමරිකාවට පැමිණීමෙන් පසු එහි සිදුවෙමින් පැවති රූපවාහිනී පර්යේෂණයන් කෙරෙහි ඔහු සිත යොමු කළා. සාර්ථක පර්යේෂණ කිපයක නිරත වීමෙන් පසුව ඔහුට රූපවාහිනී යන්ත්‍රය සම්බන්ධව ඉතා වැදගත් උපකරණයක් සාදා ගත හැකි වූවා. එය හඳුන්වන්නේ ICONSOCOPE TUBE යන නමින් රූපවාහිනී යන්ත්‍රය තුළින් ක්‍රමවත්ව කිසියම් රූපයක් දුරකට යැවීම සම්බන්ධව සාර්ථක පර්යේෂණවල නියැලුන ජෝන් ලොගි බෙයාර්ඩ් ෂ්වොරීන් ගේ මෙම සොයා ගැනීම් බෙහෙවින් ප්‍රයෝජනවත් වූවා. ස්කොට් ජාතික ඉංජිනේරුවරයෙක් වූ ලොගී බෙයාර්ඩ් රූපවාහිනී ශිල්පය පිළිබඳ ලබා තිබූ සිය අත්දැකීම් රැස භාවිත කරමින් රූප කිහිපයක් ම තිරය මත ප්‍රදර්ශනය කරන්නට සමත් වූවා. රූපවාහිනී තිරයක මුලින් ම පෙන්වන ලද මිනිස් රූපය වූ 'ටෙන්ටන්' නමැති මෙහෙකාර දැරිය ගේ රූපය ලොගි බෙයාර්ඩ් ගේ සමත්කම් විදහා පාන්නට සමත් වූවා. කෙසේ වුවත් ඔහු බොහෝ දෙනා අතරේ ප්‍රසිද්ධියට පත් වූයේ, එංගලන්තයට පැමිණි සුප්‍රකට සිනමා නළුවෙකු ගේ රූපයක් සැතපුම් 600 ක් ඈතින් පිහිටි කොපෙන්හෙගන් දක්වා යැවීමෙන් පසුවයි. ඒ 1932 වසරේදී ය.

**1945 වන විට බලවත් රටවල් සතු රූපවාහිනී තාක්ෂණික හැකියාව සහ දේශපාලන මැදිහත්වීම ඔස්සේ අතමිට මුදල් ගැවසෙන අයට පහසුවෙන් භාවිත කළ හැකි උපකරණයක් ලෙස, විශාල ගණනින් රූපවාහිනී යන්ත්‍ර වෙළෙඳ පොළෙට නිකුත් වූවා.**

නිප්කොව්, ෆ්‍රැන්ස්වර්ත්, ව්ලැඩිමර්, සහ බෙයාර්ඩ් වැනි තනි පුද්ගලයන් වගේ ම මාර්කෝනි ගුවන් විදුලි සමාගම සහ ඇමරිකානු ගුවන් විදුලි සමාගම වැනි විශාල ආයතන ද රූපවාහිනිය සම්බන්ධ පර්යේෂණ සිදුකරමින් සිටියා. මේ නිසා ම රූපවාහිනී යන්ත්‍ර නිපදවීම සම්බන්ධව ඇමරිකාව, බ්‍රිතාන්‍ය, ජර්මනිය, රුසියාව වැනි රටවල් අතර තරගකාරී ස්වභාවයක් මතු වූවා. කෙසේ වුව ද පර්යේෂණයන් සාර්ථකව නිමවෙමින් හා හා පුරා කියා රූපවාහිනිය දෙරට වැඩියේ 1939 දී 'ඇමරිකාවේ' නිව්යෝර්ක් ලෝක වෙළෙඳ පොළෙ උත්සවයේදී ය.

ආරම්භක අවදියේ දී රූපවාහිනිය, නාගරික ධනවත් ප්‍රභූ පංතියට පමණක් සීමා වූ උපකරණයක් බවට පත් වූවා. රූපවාහිනිය සේවා පවත්වා ගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී රජයේ ධනවත් උදව්කරුවන්ට වැඩි සැලකිල්ලක් දැක්වීමත් දේශපාලකයන් හා එම පිරිස් අතර වූ සමීප සම්බන්ධතාවත් රූපවාහිනියේ ඉදිරි ගමන් මගට බෙහෙවින් බලපෑම් ඇති කළා. 1945 වන විට බලවත් රටවල් සතු රූපවාහිනී තාක්ෂණික හැකියාව සහ දේශපාලන මැදිහත්වීම ඔස්සේ අතමිට මුදල් ගැවසෙන අයට පහසුවෙන් භාවිත කළ හැකි උපකරණයක් ලෙස, විශාල ගණනින් රූපවාහිනී යන්ත්‍ර වෙළෙඳ පොළට නිකුත් වූවා. රූපවාහිනී යන්ත්‍ර ජනතාව අතර සීග්‍රයෙන් ව්‍යාප්තවීම වසරින් වසර වර්ධනය වන්නේ ඉන් පසුව යි. එය කොතරම් ද යත්, 1936 දී ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර 50 ක් තරම් වූ රූපවාහිනී යන්ත්‍ර සංඛ්‍යාව 1960 වන විට ඇමරිකාව පුරා මිලියන 57.3 ක් දක්වා වර්ධනය වි තිබුණා.

බ්‍රිතාන්‍යයේ තත්ත්වයත් ඊට නොදෙවෙනි යි. 1946 ලන්ඩන් නුවර තිබූ රූපවාහිනී යන්ත්‍ර ප්‍රමාණය 23000 ක් පමණ වූ අතර එය 1947 වන විට 100,000 ක් දක්වා වර්ධනය

වී තිබුණා. 1936 වර්ෂයේදී බී. බී. සී. (B. B. C.) රූපවාහිනී ආයතන පිහිටුවීමෙන් අනතුරුව 1948 දී බර්ලිනයේ පැවති ඔලිම්පික් ක්‍රීඩා උළෙල සජීවීව රූපවාහිනියෙන් විකාශය වීමත් සමඟ මෙම ව්‍යාප්තිය සීඝ්‍ර වූ අතර රූපවාහිනී යන්ත්‍රවල මිල ක්‍රමයෙන් පහත වැටීමත්, බ්‍රිතාන්‍ය ඇමරිකාව, ප්‍රංශය, ජර්මනිය වැනි රටවල කුඩා රූපවාහිනී මධ්‍යස්ථාන එක් වී රූපවාහිනී ජාලා පිහිටුවා ගැනීමත් රූපවාහිනිය ලෝකයේ අස්සක් මුල්ලක් නැර පැතිර යන්නට හේතු වූවා.

චන්ද්‍රිකා පාදක රූපවාහිනී සේවයක් ආරම්භ වන තෙක් ප්‍රධාන රූපවාහිනී මධ්‍යස්ථානයන් වූ රටවල් විසින් ක්‍රියාත්මක කළ රූපවාහිනී ජාලාවන් ගේ සේවය රූපවාහිනිය නිර්මාණය වීමේ හා ව්‍යාප්ත වීමේ කෙටි ඉතිහාසය තුළ විශාල වැදගත්කමක් ඇති කරනු ලබනවා. රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කිරීමත්, එහි තාක්ෂණය දියුණු කිරීමත් රූපවාහිනී සේවා ව්‍යාප්ත කිරීමත්, ලෝකය තුළ මහා පරිමාණයේ වෙළෙඳ ව්‍යාපාරයක් බවට පත්වීමත්, බලවත් රටවල දේශපාලන මැදිහත්වීමත් එම ගෞරවය හිමිකර දීමට හේතු වෙනවා. රූපවාහිනී ජාලා ව්‍යාප්ත කිරීමේ මූලික පදනමේදී බ්‍රිතාන්‍යයේත් ඇමරිකාවේත් දෙනෙත් යොමු වී තිබුණේ ආසියා ශාන්තිකර කලාපයට යි. එම ප්‍රදේශවල එකල රූපවාහිනිය ජනප්‍රිය කරවීම ඔවුන ගේ මඩි තර කර ගැනීමේ පහසුම මාර්ගයක් වූවා.

ඇමරිකාව, බ්‍රිතාන්‍ය, ප්‍රංශය වැනි රටවල් ඔවුන ගේ දේශසීමා තුළ ක්‍රියාත්මක කළ රූපවාහිනී විකාශයන් 1940 අගභාගයේදී එම සීමාවන් අතික්‍රමණය කරන්නට සමත් වූවා. ඇමරිකාවේ ප්‍රධාන නගර වූ කැනඩාව හා මෙක්සිකෝව එහි සීමාවෙන් පිටත වෙසෙන නරඹන්නන් විශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ගනිමින් රූපවාහිනී වැඩසටහන් කීපයක් විකාශය කළා. සජීව ආකාරයෙන් කෙරුණු බොහොමයක් වැඩසටහන් නරඹන්නන් කුල්මත් කරන්නට සමත් වූවා.

කෙසේ වුව ද අන්තර්ජාතික මට්ටමේ පළමු විධිමත් රූපවාහිනී වැඩසටහන් හුවමාරුව සිදු වූයේ 1950 අගෝස්තු 21 වනදා. ඒ එංගලන්තය හා ප්‍රංශය අතර, එංගලන්තයේ රූපවාහිනී උපකරණ භාවිත කරමින් සිදු කළ මෙම විකාශනය සමාරම්භක වැඩසටහන විකාශනය වූයේ SALIAS සිට DOVER දක්වා යි. තාක්ෂණික බාධා නිසා මෙම ප්‍රයත්නය අසාර්ථක වුවත් ඔවුන් විසින් ම 1952 ජූලි මාසයේදී සියලු බාධක ජයගනිමින් ද්වි පාර්ශ්වික රූපවාහිනී වැඩසටහන් ඉතා

**මෙතෙක් ඇමරිකාව, යුරෝපය, රුසියාව, ප්‍රංශය වැනි බටහිර කලාපයේ ක්‍රියාත්මක වූ රූපවාහිනී ජාලා 1970 වන විට ආසියාකරයටත් අත්විඳින්නට හැකි වූවා. මෙහිදී ආසියාවේ නායකත්වය ජපානයට හිමිවීම විශේෂ සිද්ධියක්.මෙම නායකත්වයට පත්වීම සඳහා ජපානය වෙත තිබුණු සුදුසුකම වූයේ 11 වන ලෝක යුද්ධයට පෙර පටන් එනම්, 1930 ගණන්වල පමණ සිට ම රූපවාහිනිය සම්බන්ධයෙන් ජපානය කර තිබූ පර්යේෂණයනු යි.**

සාර්ථකව හුවමාරු කරගනු ලැබුවා. මෙම සිදුවීම රූපවාහිනී සේවා ව්‍යාප්ත කිරීමේ ඉතිහාසය තුළ සිදු වූ විශේෂ අවස්ථාවක් නිර්මාණය කළා. මෙම අත්හද බැලීම නිසා ඉතා කෙටි කාලයක් තුළ එනම්, අවුරුදු 10 ටත් අඩු කාලයක් තුළ යුරල් කඳුවැටි හරහා යුරෝපයටත්, අත්ලන්තික් සාගර කලාපය හරහා කැලිෆෝනියාවටත් රූපවාහිනී ජාලයන් සම්බන්ධ කරවීමේ ප්‍රථම ප්‍රායෝගික පියවර තමන් විසින් ක්‍රියාත්මක කළ බව ප්‍රංශය හා එංගලන්තය පවා නොදැන සිටීම එම අවස්ථාවයි.

මෙලෙස යුරෝපය තුළ ආරම්භ වූ නව රූපවාහිනී ජාලය යුරෝවිෂන් (EUROVISION) නම් වූ අතර එමගින් වර්ධනය වෙමින් පැවතුන ප්‍රාදේශික හා මහද්වීපික අන්තර් ජාලයන් දියුණු කිරීමේ අවස්ථාවන් හා සංරෝධකයන් හඳුනාගැනීමට බෙහෙවින් උපකාර වූවා. අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්විය හැකි භූගෝලීය ප්‍රදේශයක් තිබීමත්, උසස් තාක්ෂණික ඥනයක් සතුවීමත් සංස්කෘතික අනුකූලතාව යන්නත්, ඒ සියල්ලටමත් වඩා ශක්තිමත් ලෙස ඉදිරියට යන විවිධ මට්ටමේ ප්‍රාදේශීය ජන සමූහයක් සිටීමත් යුරෝපයට වාසිදායක තත්ත්වයක් උදා කළා. ප්‍රාදේශීයව යුරෝවිෂන් ලැබූ මෙම දියුණුව කොමියුනිස්ට් ජාතීන්ටත් ඔවුන් ගේ දේශ සීමා තුළත් රූපවාහිනී විකාශනයන් ආරම්භ කිරීමට පෙළඹවීමත් ඇති කළා. එහි ප්‍රතිඵලයක් ලෙස යුරෝපයත් සෝවියට් සමූහ ආණ්ඩුවත් අතර තාක්ෂණයෙන් මනා තත්ත්වයක පැවති ඉන්ටර්විෂන් (INTERVISION) සේවය ආරම්භ වූවා. මෙමගින් විශාල භූමි ප්‍රදේශයක් ආවරණය වන වැඩසටහන් විසුරුවා හරින්නට සමත් වූවා. අවසානයේදී මෙතෙක් තරඟකාරී ලෙස ඉදිරියට පැමිණෙමින් තිබූ යුරෝවිෂන් සේවයේ ප්‍රධාන තරඟකරුවා බවට පත්වූයේ ඉන්ටර්විෂන් සේවය යි.

දේශසීමා තුළ හා ඉන් පිටත ප්‍රාදේශීය වශයෙන් ඇති වූ තරඟකාරීත්වය කෙටි කාලයක් තුළදීම ව්‍යාපාරික හා දේශපාලනික හැඩතල ගන්නට වූවා. මේ වන විට ප්‍රධාන රූපවාහිනී ජාලයන් ක්‍රියාත්මක වූ රටවල් භූගෝලීය වශයෙන් තමන්ට සමීප රටවල් ඉලක්ක කර ගනිමින් සිය දේශපාලනික මතවාද හා අරමුණු ක්‍රියාත්මක කරවීම ආරම්භ කර තිබුණා. අර්බුදයක් හටගෙන තිබුණු බටහිර හා නැගෙනහිර ජර්මනියේ නරඹන්නන් අරමුණු කර රූපවාහිනී සේවා මගින් ගෙන ගිය ඉලෙක්ට්‍රොනික යුද්ධය මෙයට කදිම නිදසුනක්. ඒවාගේම 1963 දී ආක්ටික් කලාපයේ පිහිටුවා තිබුණු රුසියානු රූපවාහිනී මධ්‍යස්ථානය මගින් උතුරු නෝර්වීජියානුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා විකාශනය කළ වැඩසටහන්වල කොමියුනිස්ට් ලකුණ පැහැදිලිව පෙනෙන්නට තිබුණා. උතුරු කොරියානු අධිකාරීන් විසින් දකුණු කොරියානුවන් සඳහා පිළියෙල කළ වැඩසටහන්වල ද මෙම ලක්ෂණ අන්තර්ගත වූවා.

මෙතෙක් ඇමරිකාව, යුරෝපය, රුසියාව, ප්‍රංශය වැනි බටහිර කලාපයේ ක්‍රියාත්මක වූ රූපවාහිනී ජාලා 1970 වන විට ආසියාකරයටත් අත්විඳින්නට හැකි වූවා. මෙහිදී ආසියාවේ නායකත්වය ජපානයට හිමිවීම විශේෂ සිද්ධියක්. මෙම නායකත්වයට පත්වීම සඳහා ජපානය වෙත තිබුණු සුදුසුකම වූයේ II වන ලෝක යුද්ධයට පෙර පටන් එනම්, 1930 ගණන්වල පමණ සිට ම රූපවාහිනිය සම්බන්ධයෙන් ජපානය කර තිබූ පර්යේෂණයනු යි. යුද්ධය අතර තුර එම පර්යේෂණයන් නැවැත්වීමට සිදු වුවත් යුද්ධයෙන් පසු ක්‍රියාත්මක වූ ජපානය ඈත පෙරදිග ප්‍රදේශවල රූපවාහිනී සේවාවන් වර්ධනය කිරීමට ඉදිරිපත් වීමෙන් තමන්ට විශාල ව්‍යාපාරික ලාභයක් ලබා ගත හැකි බව ද කල්පනා කර තිබුණා. බලාපොරොත්තු සඵල කරගනු වස් ජපන් රජය පළමුවෙන් ම ආසියාවේ දේශපාලනික හා ආර්ථික බලය ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබුවා. II වන ලෝක යුද්ධයේ දී විවිධ රාජ්‍යයන්වල හමුදා සේනාංකවලට ජපාන හමුදා නිලධාරීන් සම්බන්ධ කිරීමත් එම රටවල ගුවන් විදුලි හා රූපවාහිනී සේවා ක්‍රියාත්මක වූ මාධ්‍ය අංශයන්ට ජපාන නිලධාරීන් සහභාගී කරවීමෙන් ලැබූ අත්දැකීම් ආදියත් බලාපොරොත්තු මල්ඵල ගැන්වීමට සමත් වූවා. ඒ වගේ ම ආසියාකරයේ රූපවාහිනී සේවාවක් ආරම්භ කිරීම සඳහා සංවිධානය කරගත් "ආසියානු විකාශකයන් ගේ සමුළුවේ දී" (ASIAN BROAD-CASTERS CONFERENCE) ජපාන රූපවාහිනී නිෂ්පාදනයන් විශාල ගණනක් ප්‍රදර්ශනය කර ගැනීමට ජපානයට අවස්ථාව උදාවූවා. ඒ 1957 දී. 1957, 58 සහ 60 යන වර්ෂවල දී එම සමුළුවේ සැසිවාර ටෝකියෝ නුවර පැවැත්වීමට කටයුතු කිරීමටත් ජපානයට හැකි වූවා. මෙහිදී සමුළුවේ නායකයන්ට හැඟී ගොස් තිබුණේ චීනය හා ඉන්දියාව වැනි ආසියාකරයේ විශාල රටවල් අභිබවා යන අන්දමේ රූපවාහිනී තාක්ෂණයක් ජපානය සතුව පවතින බව යි.

1962 පමණ වන විට ආසියානු විකාශකයන් ගේ සමුළුව වෙනස් මුහුණුවරක් ගැනීමට පටන් ගත්තා. එහි නම පවා "ආසියානු විකාශකයන් ගේ සමාගම" සංගමය

බවට පත් වූවා. ඔවුන් ගේ අභිප්‍රාය වී තිබුණේ ජපානයට පෙර තමන් විසින් හැකි ඉක්මනින් ප්‍රාදේශීය රූපවාහිනී ජාලයන් ගොඩ නැංවීම යි. පළමුව මේ අදහස ඇති වූයේ ජපානයට නමුත්, ඊට ඉඩ නොතබා ආසියානු විකාශකයන් ගේ සංගමය තමන් ගේ ඒකාධිකාරය මුළු ආසියාකරය පුරා ම පතුරුවන්නට කටයුතු කළා.

කෙසේ වූවත් ජපානය සිය උත්සහය අත්හළේ නැහැ. එහි රූපවාහිනී උපකරණ සපයන ව්‍යාපාරිකයන් හා විකාශකයන් ගේ අත්වැල් බැඳ ගැනීමෙන් ASIA VISION නමින් නව සංගමයක් බිහි වූවා. ඒෂියා විෂන්, ජපානයේ මහා පරිමාණයේ වානිජ ජාලයන්ගෙන් එකක් වන FUJI T. V. හි සම්පූර්ණ අයිතිය සතු උප සමාගමක් ලෙස සිය කටයුතු ඉදිරියට ම ගෙන ගියා. මෙය මූලිකව ම වෙළෙඳ හවුලක් වූ අතර ගිනිකොන දිග ආසියා කලාපයේ රූපවාහිනී යන්ත්‍ර හා විකාශන උපකරණ ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සොයා බැලීමක් ද එමගින් සිදු කළා. මෙහි ප්‍රතිඵලයක් ලෙස ASIA VISION රූපවාහිනී ජාලයේ විකාශන සම්බන්ධතාවන් ඔකිනාවා සිට පිලිපීනය දක්වාත්, ප්‍රධාන වශයෙන් ආසියානු මහද්වීපයේ චීනයෙන් පසු කරමින් ලාඕසය, කාම්බෝජය, තායිලන්තය, පකිස්තානය හා ඉන්දියාව දක්වා ව්‍යාප්ත කරනු ලැබුවා. මෙයට කොරියානු රූපවාහිනී පද්ධතීන් ද ඇතුළත් වූවා.

ජපාන ආධාර යටතේ සමහර රටවල රූපවාහිනී සේවා අරඹන්නට ඉඩ සලසා ගැනීමෙන්, එම රට තුළ ජපන් රූපවාහිනී යන්ත්‍ර හා සෙසු උපකරණ සඳහා ඉතා හොඳ වෙළෙඳ පොළ තත්ත්වයක් ඇති කර ගැනීමටත්, සිය වැඩසටහන් එම රූපවාහිනී සේවා මගින් විකාශනය කර ගැනීමටත් යාමෙන් ජපානයේ කාරුණික අනුග්‍රහයේ තරම පෙනෙන්නට ගත්තා. තායිවාන් රූපවාහිනී සේවය මගින් ජපන් නිෂ්පාදනයන් පිළිබඳ ප්‍රචාරය කිරීමටත්, ජපන් වැඩසටහන් නිශ්චිත ගණනක් විකාශය කිරීමටත් ඉඩ ප්‍රස්ථා ලබා ගැනීම මෙයට එක් නිදසුනක්.

ජපානය ආසියාකරයේ ප්‍රමුඛයන් වීමට කටයුතු කළ මේ අවදියේ දී, සමහර රටවල් සම්බන්ධයෙන් පැන නැගුණු දේශපාලනමය ගැටලු ඔවුන් ගේ අරමුණුවලට බාධාවන් එල්ල කිරීමට සමත් වූවා. 1962 දී ජපානය හා චීනය අතර ඇති වූ

**යුරෝපයේ ප්‍රාදේශීය රූපවාහිනී ජාලයන් හැරුණු කොට වඩාත් සැලසුම් සහගත ලෙස පවත්වාගෙන ගිය අනෙක් රූපවාහිනී ජාලය වූයේ ලතින් ඇමරිකානු රූපවාහිනී ජාලය යි. ඉතා සීඝ්‍රයෙන් දකුණු ඇමරිකාව හරහා ව්‍යාප්ත වූ මෙම සේවය මගින් ප්‍රථම සජීව වැඩසටහන ලතින් ඇමරිකානු නරඹන්නන් සඳහා ඉදිරිපත් කර තිබුණා.**

ගිවිසුම එවන් එක් අවස්ථාවක්. මෙම ගිවිසුමේ අරමුණ වූයේ, ASIA VISION හි අනුග්‍රාහකයා වූ FUJI T. V. චීන රජයන් සමඟ එක්ව් දෙපාර්ශවයට ම ප්‍රයෝජනවත් විය හැකි රූපවාහිනී සේවයක් තොමෝසාවල ආරම්භ කිරීම යි. අප්‍රේල් මාසයේ දී එම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට යාමේ දී ඇති වූ පරස්පරතාවන් නිසා චීන පාර්ලිමේන්තුව එය අවලංගු කිරීමේ යෝජනාවක් සම්මත කළා. මෙය විශේෂයෙන් ම දෙරටේ විදේශ තානාපති කාර්යාල අතර උණුසුම් දේශපාලන වාතාවරණයක් ඇති කිරීමට හේතු වූවා. බාධාවන් කෙලෙස එල්ල වූවත් රූපවාහිනී තාක්ෂණය සම්බන්ධව ගත් කළ ලෝකය තුළ ජපානය ඉදිරියෙන් සිටි යි. පැහැදිලි දසුන් මවන නවතම HDTV රූපවාහිනී තාක්ෂණය නිර්මාණය කිරීමේ ගෞරවයට පවා හිමිකම් කියන්නේ ජපානය යි.

ආසියාවේ තත්ත්වය මෙබඳු වූවත් අප්‍රිකානු රටවල හා මැද පෙරදිග රූපවාහිනී සේවා ආරම්භ කිරීමේදී පැහැදිලිව ම දේශපාලන හා ආර්ථික දුෂ්කරතා විසින් එය වලක්වාලනු ලැබුවා. ප්‍රාදේශීය වශයෙන් හෝ අරාබිකරයේ රූපවාහිනී ජාලයක් ගොඩ නැංවීම සඳහා තිබූ එකම ශක්තිමත් කණ්ඩායම වූයේ අබ්දුල් ගමාල් නසාර් ප්‍රමුඛ දේශපාලන කණ්ඩායම පමණයි. ඊජිප්තුවේ පැවති ප්‍රාදේශීය රූපවාහිනී ක්‍රමය දියුණු කර ගැනීමට කටයුතු කිරීමෙන් ඔවුන් ඒ පිළිබඳ පූර්ව අත්දැකීම් ලබා තිබුණා. 1963 දී ඇමරිකානු විකාශන සමාගම (AMERICAN BROADCASTING COMPANY) විසින් මූලික වශයෙන් සිය දැන්වීම් හා වැඩසටහන් ප්‍රචාරය කිරීමේ මූලික අරමුණෙන් යුතුව සිරියාව, ලෙබනනය, කුවේටය, ඉරාකය, ජෝර්දානය වැනි රටවල් එක්කරමින් අරාබි මැද පෙරදිග ජාලය (ARAB MIDDLE EAST NETWORK) ආරම්භ කළා. ඉහත රටවල් ඇමරිකානු විකාශන සමාගමේ අනුබද්ධ ආයතන බවට පත් වි ව්‍යාපාරිකයන්, දැන්වීම්කරුවන්, නිලධාරීන් හා රූපවාහිනී මධ්‍යස්ථාන නියෝජිතයන් 5000 ක් පමණ දෙනා සහභාගී වූ BEIRUT හි පැවතුණු රූපවාහිනී ජාලයන් සංවිධානය කිරීමේ සමුළුවට සහභාගි වීම රූපවාහිනී ඉතිහාසයේ විශේෂ සිදුවීමක් වූවා. ප්‍රබල රටවල ධනවත් ව්‍යාපරිකයන් ගේ සිතුම් පැතුම්වලට අවස්ථාවන් උද කරදීම මෙවැනි සමුළු තුළින් සිදු වූවා.

යුරෝපයේ ප්‍රාදේශීය රූපවාහිනී ජාලයන් හැරුණු කොට වඩාත් සැලසුම් සහගත ලෙස පවත්වාගෙන ගිය අනෙක් රූපවාහිනී ජාලය වූයේ ලතින් ඇමරිකානු රූපවාහිනී ජාලය යි.

**කෙසේ වුවද ලොව පුරා විවිධ බලවත් රටවල් තමන් ගේ ආර්ථික හා දේශපාලන බලය තහවුරු කරගැනීමට රූපවාහිනිය ආයුධයක් කරගෙන තිබෙනවා. ඉතිහාසය සාක්ෂියක් කර තබාගෙන බැලුව විට මේ එකැස් යෝධයාගේ නැතහොත් රූපවාහිනියේ වර්තමානය සහ අනාගතය කෙබඳු ද?**

ඉතා සීඝ්‍රයෙන් දකුණු ඇමරිකාව හරහා ව්‍යාප්ත වූ මෙම සේවය මගින් ප්‍රථම සජීව වැඩසටහන ලතින් ඇමරිකානු නරඹන්නන් සඳහා ඉදිරිපත් කර තිබුණා. එය උරුගුව ආසන්නයේ පිහිටා තිබුණු PUNTA DEL ESTE හිදී පැවැත් වූ ඇමරිකානු ජනපද සමුළුවේ ප්‍රවෘත්ති වාර්තා වැඩ සටහනකි. මෙම සේවා ආරම්භ කිරීමට වසරකට පෙර පටන් ලතින් ඇමරිකානු විදුලි සංදේශ විශාරදයෝ මහද්වීපයන් අතරේ රූපවාහිනී ජාලයන් ගොඩනැංවීමට මෙක්සිකෝවේදී සාකච්ඡා පවත්වමින් සිටියා.

මෙක්සිකානු ජනතාව අතර අභිනව රූපවාහිනී සේවාවක් නිර්මාණය කිරීමේ සිහිනය ඇති වූයේ ඒ අනුව යි. සිහින සැබෑ කරමින් 1964 දී ඇමරිකානු මධ්‍යම රූපවාහිනී අන්තර්ජාලය, (CENTRAL AMERICAN TELEVISION NETWORK) නිකරගුවාව, කොස්තාරිකාව, ගුවාතමාලාව, පැනමාව, හොන්ඩුරාස් හා එල්සැල්ව දෝරය යන රටවල් ද හවුල් කරගනිමින් මෙක්සිකානු රූපවාහිනී සේවය ආරම්භ කළා. පසු කාලයකදී මධ්‍යම ඇමරිකානු රූපවාහිනී ජාලය වෙළෙඳ දැන්වීම් හා ඔවුන් ගේ වැඩසටහන් අලෙවි කරනු ලබන සංවිධානයක් බවට පත්වූවා. 1963 දී මෙම රූපවාහිනී රටවල් 06 න් පහක් ම (පැනමාව හැර) යූරෝපීය පොදු වෙළෙඳ පොළට සමාන මධ්‍යම ඇමරිකානු නිදහස් වෙළෙඳ කලාපයක් ඇති කළා.

සාමාජික රටවල් අතර වූ වෙළෙඳම් පිළිබඳ ගැටළු අඩු කරගන්නට එය සමත් වූවාක් මෙන් ම ඒ සඳහා 1965 දී ව්‍යාපෘතියක් සකස් කර ගන්නටත් ආර්ථික මට්ටම ඉහළ මට්ටමකින් පවත්වාගෙන යමින් වාර්ෂික ඒක පුද්ගල ආදායම ඩොලර් 250 ක් දක්වා වර්ධනය කර ගැනීමට බැංකුවක් ද පිහිටුවනු ලැබුවා. කුමන දෙය වාර්තා කිරීමට සිදු වූවත් මේ තත්ත්වය තුළ රූපවාහිනියට සිදු වී තිබුණේ තම භූමිකාව තුළින් මධ්‍යම ඇමරිකානු ජාතීන් දේශපාලනමය හා ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමයි.

කෙසේ වුවද ලොව පුරා විවිධ බලවත් රටවල් තමන් ගේ ආර්ථික හා දේශපාලන බලය තහවුරු කරගැනීමට රූපවාහිනිය ආයුධයක් කරගෙන තිබෙනවා. ඉතිහාසය සාක්ෂියක් කර තබාගෙන බැලුව විට මේ එකැස් යෝධයාගේ නැතහොත් රූපවාහිනියේ වර්තමානය සහ අනාගතය කෙබඳු ද?

❑